ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - ජූලි 2021

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී මෙවර බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි. ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක 01

අනිවාර්ය ප්‍රශ්නයක් වන මෙහි 1.1 සිට 1.10 දක්වා බහුවරණ ආකාරයේ ප්‍රශ්න 10 කින් සමන්විතය. මේ කොටස සඳහා බොහෝ අයදුම්කරුවන් වැඩි ප්‍රශ්න සංඛ්‍යාවක් සඳහා නිවැරදි උත්තර සපයා තිබූ බව පෙනේ.

එසේම 1.11 සහ 1.12 දක්වා ප්‍රශ්නයන්හි තැනට සුදුසු උත්තරය, දෙන ලද දෙන ලද උත්තර දෙක අතුරෙන් තෝරාගත යුතු වූ අතර, ඒ සඳහා ද බහුතරයක් අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි.

1.13 සහ 1.14 දක්වා ප්‍රශ්න දෙකද එවැනිම තේරීමක් එනම්, දෙන ලද දෙන ලද ප්‍රකාශය සත්‍ය අසත්‍ය බව දැක්වීමක් කළ යුතුව තිබුණි.

නමුත් 1.15 සිට 1.20 දක්වා ප්‍රශ්නවලට කෙටි උත්තර සැපයීමට සිදුව තිබුණි. මෙම කොටස සඳහා සපයා තිබූ උත්තරවල බොහෝ විට අඩුපාඩුකම් දක්නට ලැබුණි. මෙම කොටස මඟින් විෂය නිර්දේශයේ බොහෝ න්‍යායාත්මක කොටස් පිළිබඳව විමසා තිබුණි.

### ප්‍රශ්න අංක 1.15

බොහෝ සිසුන් වැරදි ලෙස පිළිතුරු සපයා තිබුණි. පාරිභෝගික ආදායම් ව්‍යාප්තිය, භාණ්ඩයේ ස්වරූපය යනාදිය ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන සාධකයැයි ලියා තිබුණි. සලකා බලන භාණ්ඩයේ මිල ද, සම්බන්ධිත භාණ්ඩයේ මිල ද යන්න සඳහන් නොකර පිළිතුරු ඉදිරිපත් කර ඇත.

### ප්‍රශ්න අංක 1.16

සිසුන් ආදේශන හා ආදායම් ප්‍රතිවිපාකය නිවැරදිව හඳුනාගෙන නොමැත. ආදායම් ප්‍රතිවිපාකය ආදායමේ සිදුවන වෙනසක් නිසා සිදුවන බවට, වැරදි පිළිතුරු සපයා ඇත.

### ප්‍රශ්න අංක 1.17

සැපයුම් මිල නම්‍යතාව තීරණය කරන සාධක ලෙස ඉල්ලුම් මිල නම්‍යතාවය තීරණය කරන සාධකයක් වන භාණ්ඩය නිර්වචනය කරන ආකාරය, සලකා බලන භාණ්ඩයට ඇති ආදේශක භාණ්ඩ ප්‍රමාණය යනුවෙන් දක්වා තිබුණි.

**ප්‍රශ්න අංක 1.18**

සමහර සිසුන් පරිමාණානුකූල ඵල වල අදියර සඳහා හීනවන ඵලදා න්‍යාය ගැන පවසා එහි එන ඵලයන් වන හීනවන ඵල, වැඩෙන ඵල හා ස්ථාවර ඵල, පරිමාණානුකූල ඵල ලෙස ඉදිරිපත් කර ඇත.

**ප්‍රශ්න අංක 1.19**

ගිණුම්කරණ ලාභය හා ආර්ථික ලාභය අතර වෙනස ලිවීමේදී ගිණුම්කරණ ලාභය යනු ව්‍යාපාරයක් තුළ ගිණුම් පොත්පත් වල පවතින යම් කාල පරිච්ඡේදයකට ආදාල ගණිතමය පසුබිමක් ඇසුරින් තීරණ ගන්නන්ට ලබා දෙන ලාභය ලෙසත්, ආර්ථික ලාභය යනු ආර්ථිකය පිළිබඳව අධ්‍යයනය කොට ලබාගන්නා තොරතුරු ඇසුරින් සැකසුණු දෙයක් ලෙස වැරදියට ලියා ඇත. මේ පිළිබඳව සිසුන්ට නිවැරදි අවබෝධයක් නොතිබූ බව පෙනේ.

**ප්‍රශ්න අංක 1.20**

කෙටිකාලීන සම්පත් උපයෝගී කරගෙන කෙරෙන නිෂ්පාදනය, කෙටිකාලීන නිෂ්පාදනය ලෙස අයදුම්කරුවන් වැරදි සහගත ලෙස පිළිතුරු සපයා ඇත. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ස්ථාවර හා විචල්‍ය යන සාධක වර්ග දෙකම දැකිය හැකි බව ඉදිරිපත් කිරීමට බොහෝ සිසුන් අසමත් වී ඇත.

## <u>B කොටස</u>

එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

**ප්‍රශ්න අංක 02**

**(a)** මිශ්‍ර ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ 3 ලයිස්තුගත කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට උත්තර අර්ථ ක්‍රම යටතේ ස්ව-අධ්‍යයන පාඨමාලා පොතේ පැහැදිලි කර තිබුණද බොහෝ සිසුන් මිශ්‍ර අර්ථ ක්‍රමය සඳහා වෙළෙඳපොළ අර්ථ ක්‍රමයේ ලක්ෂණ ඉදිරිපත් කර තිබුණි. සමහර සිසුන් කරුණු දැන සිටියද නිවැරදිව ගලපා ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත.

**(b)** වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නේ කෙසේදැයි යන්න පැහැදිලි කිරීමේ දී, මූලික ආර්ථික ප්‍රශ්න නිවැරදිව ලිවීමට අපොහොසත් වී තිබුණි. එක් එක් ආර්ථික ප්‍රශ්න විසඳන අයුරුත්, මූලික ආර්ථික ප්‍රශ්න විසඳන අකාරයත් වැරදි ආකාරයට ඉදිරිපත් කර ඇති අතර, සමහර මූලික ආර්ථික ප්‍රශ්න 3 පමණක් ලියා ලකුණු අඩක් පමණක් ලබාගෙන තිබුණි. මේ මගින් පෙනෙන්නේ බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය පැහැදිලිව අවබෝධ කරගෙන නොමැති බවය.

**(c)** අවශ්‍යතා හා උවමනා අතර වෙනස එකිනෙකට උදාහරණ සහිතව පිළිතුරු සැපයීමට බොහෝ සිසුන් සමත්වී තිබුණි. සාර්ථක පිළිතුරු සැපයීමට සියළුම අයදුම්කරුවන් සමත්වී තිබුණි. අවශ්‍යතාවලට උදාහරණ පැහැදිලි කිරීමත්, අවශ්‍යතා සීමිත බවත්, පොදු බවත් සඳහන් කර තිබුණි. උවමනා අසීමිත බවත්, පුද්ගලයගෙන් පුද්ගලයාට වෙනස් වන බවත් අවශ්‍යතා, ඉටු කර ගන්නේ උවමනා මගින් බවත් සඳහන් කර තිබුණි.

## ප්‍රශ්න අංක 03

**(a)** මෙම සමීකරණය විසඳීමට වීජ ගණිතමය දැනුම අවශ්‍ය විය. එම දැනුම උපයෝගී කරගෙන පළමු කොටසට නිවැරැදි පිළිතුරු සපයා මුළු ලකුණු ප්‍රමාණය ලබා ගත් සිසුන් බොහෝ වෙතත්, සමහර සිසුන්ට ගණිතමය දැනුම මද බැවින් දුර්වලතා දක්වා තිබූ අයුරු පිළිතුරු පත්‍රවලින් මනාව දක්නට ලැබුණි. එම නිසා මෙම කොටසට සම්පූර්ණ ලකුණු ලබා නොගත් අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් ඇත.

**(b)** රජය විසින් භාණ්ඩයක් මත සමතුලිත මිලට වඩා අඩුවෙන් උපරිම මිලක් පැනවීම මගින් ඇතිවිය හැකි ප්‍රතිවිපාක ප්‍රස්ථාරිකව පැහැදිලි කිරීමට බොහෝ සිසුන් අසමත් වී ඇත. උපරිම මිල පැනවීමෙන් ඇතිවන ප්‍රතිවිපාක බොහෝ සිසුන් නිවැරදිව ඉදිරිපත් කළ තිබුණද සමහර සිසුන් ඉදිරිපත් කළ යුතු ප්‍රධාන කරුණු තුන වන අධි ඉල්ලුමක් හටගැනීම, කලුකඩ මිලක් පැනනැගීම, සැපයුමෙහි ඌනතාවයක් ඇතිවීම, යන කරුණු ඇසුරින් කරුණු දෙකක් හෝ එකක් පමණක් ඉදිරිපත් කිරීම නිසා මුළු ලකුණු ලබා ගැනීමට අසමත් වී ඇත.

## ප්‍රශ්න අංක 04

**(a)** පූර්ණ තරඟකාරී වෙළඳපොලක ලක්ෂණ ලැයිස්තුගත කරන ලෙසට අසා තිබූ මෙම ප්‍රශ්නය, මගින් වෙළඳපොළ ව්‍යුහයන් පිළිබඳ දැනුම හා අවබෝධය පිළිබඳව විමසා තිබුණි. බොහෝ සිසුන් ව්‍යුහයන් පිළිබඳ තොරතුරු වෙනුවට වැරදි තොරතුරු ඉදිරිපත් කර තිබුණි. සමහර සිසුන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණද, සමහර සිසුන් නිසි පරිදි පරිශීලණය නොකිරීම නිසා වැරදි පිළිතුරු සපයා තිබුණි. අනෙකුත් වෙළඳපොළ ව්‍යුහයන් පිළිබඳ තොරතුරු පටලවා ගෙන වැරදි තොරතුරු ඉදිරිපත් කර තිබුණි. සමහර සිසුන් පූර්ණ තරගකාරී වෙළෙඳපොළ හා පූර්ණ තරඟකාරී ආයතන අතර වෙනස හඳුනා ගෙන නොතිබුණි.

**(b)** ශ්‍රී ලංකාව වැනි රටකට උද්ධමනය නිසා ඇතිවිය හැකි ප්‍රතිවිපාක දැක්වීමේ දී මෙම කාලීන ප්‍රශ්නයට, තම තමන්ගේ දැනුම අනුව පිළිතුරු සපයා තිබුණ බවද පැහැදිලි වේ. සාමාන්‍ය අවබෝධයකින් යුතුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව පිළිතුරු සපයා තිබුණි පොත්පත් පරිශීලනය කිරීමකින් තොරව සාමාන්‍ය දැනුමෙන් පිළිතුරු සපයා ලකුණු ලබාගත් ප්‍රශ්නයක් ලෙස මෙය හැඳින්විය හැක.

## ප්‍රශ්න අංක 05

**(a)** තීරු බදු වලට අමතරව රටක් ජාත්‍යන්තර වෙළඳාම පාලනය කිරීම සඳහා අනුගමනය කරන වෙනත් ක්‍රම යනුවෙන් අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා ලකුණු ලබා ගත් අතර සමහර සිසුන් අපනයනය වර්ධනය කරගැනීම, රජයේ සේවා නියුක්තිය වැඩි කිරීම, රේගු බදු ඉහල දැමීම, වැනි වැරදි පිළිතුරු සපයා ලකුණු ලබා ගැනීමට අපොහොසත් විය.

**(b)** **(i)** නිරපේක්ෂ වාසිය පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ සිසුන් නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ලබාගෙන තිබුණි. එහෙත් සමහර සිසුන්ට මුළු ලකුණු ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ පිළිතුරු සැපයීමේ දී **X** රට හා **Y** රට ලෙස පමණක් ලියා තිබීම නිසාය. මෙහිදී භාණ්ඩය සහල් හා තිරිඟු ලෙස සටහන් කිරීම සමහර සිසුන් අමතක කර ඇත.

**(ii)** සාපේක්ෂ හා නිරපේක්ෂ වාසිය පිළිබඳව ගණිතමය දැනුම ඇසුරින් අසා තිබූ මෙම ප්‍රශ්නයට ගණනය කිරීම නිවැරදිව සිදු කර, ඊට අයත් ලකුණු ලබාගත්තද සාපේක්ෂ වාසිය අනුව **X** රට තිරිඟු නිපදවිය යුතු බවටත් **Y** රට සහල් නිපදවිය යුතු බවටත් නිවැරදිව හඳුනාගැනීමට අසමත් වීමෙන් මුළු ලකුණු ලබා ගැනීමට අපොහොසත් විය.

**(c)** මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා නොමැත. මුදල් ගෙවීම්, මුදල් ලැබීම් ලෙසද සමහර සිසුන් වැරැදි පිළිතුරු සපයා ඇත. නිවැරදි පිළිතුරු සැපයූ සිසුන් ද සාමාන්‍ය ප්‍රමාණයක් විය. ලකුණු අඩුවෙන් ලබා ගත් අසාර්ථක ප්‍රශ්නයක් ලෙස මෙය සැලකිය හැක.

## C කොටස

### ප්‍රශ්න අංක **06**

**(A)** **(a)** රාජ්‍ය අයවැයෙහි පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් අතර වෙනස පිළිබඳ අසා ඇති මෙම ප්‍රශ්නය පිළිබඳව සිසුන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවන බව පෙනේ. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමට දරන ලද වියදම් ලෙස හැඳින්වුවත් එහි ඉතිරි වියදම් වර්ග පිළිබඳව සිසුන්ගේ දැනුම අඩු බව පෙනේ.

(b) වක්‍ර බදු පිළිබඳ අසා ඇති මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් විසින් ඍජුවම අය නොකරන හා ප්‍රතිශතයක ආකාරයෙන් අයකරන බද්දක් ලෙස දක්වා ඇත. එහෙත් සිසුන්ට මේ පිළිබඳව ඇති දැනුම අඩු බව පෙනේ.

(B) (a) ආදායම් ප්‍රවේශය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරික්ෂා කිරීම සඳහා දෙන ලද මෙම උපකල්පිත දත්ත ඇසුරින් ඉදිරිපත් කරන ලද ගැටළුවට නිවැරදිව දත්ත සැපයූ අයදුම්කරුවන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකියාව ලැබුණි. සමහර අයදුම්කරුවන්ට නිෂ්පාදන සහනාධාර අඩු කළ පසු වෙනත් බදු යන්න කෙසේ ගැලපිය යුතුද යන්න පිළිබඳව අවබෝධයක් නොමැති බව පෙනේ. මේ නිසා ඔවුන්ට උපරිම ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

(b) ජාතික ගිණුම් සැකසීමේ වැදගත්කම පිළිබඳ හොඳින් අධ්‍යයනය කළ සිසුන් මුළු ලකුණු ලබා ගැනීමට සමත් වූ අතර, සාමාන්‍ය අවබෝධයෙන් විෂයට අදාළ නොවන පිළිතුරු සැපයූ අය ද බොහෝ වේ.

(C) රාජ්‍ය ෆිස්කල් ප්‍රතිපත්තිය ගැන පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි. මේ සඳහා පිරිනමන ලද මුළු ලකුණු ප්‍රමාණයම ලබාගැනීමට සමත් විය. රාජ්‍ය ෆිස්කල් ප්‍රතිපත්තිය ගැන සටහන් කිරීමේදී බදු ආදායම, වියදම ගැන සටහන් කළ ද ණය පිළිබඳව සඳහන් කිරීම බොහෝ සිසුන් අමතක කර ඇත. මේ නිසා මුළු ලකුණු ලබා ගැනීමට අසමත් විය.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- * * * -